# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය (මාර්ගගත)

## පළමු සෙමෙස්තරය – 2020/2021

## ENH 3144 – බුදු සමය හා වර්තමාන සමාජ ප්‍රශ්න

### විවෘත ග්‍රන්ථ ලිඛිත පරීක්ෂණය

**ශිෂ්‍යයන් සඳහා උපදෙස්:**

1. ප්‍රශ්න පත්‍රය දෙවන පිටුවේ සිට ආරම්භ වේ.
2. සියලුම ලිඛිත ඇගයීම් **අත් අකුරින් පමණක්** ලිවිය යුතුය. ඔබේ අත් අකුරු **පැහැදිලි ව ලිවීමට වග බලා ගන්න.**
3. ඔබේ පිළිතුරු A4 ප්‍රමාණයේ කඩදාසියක ලියන්න (සීආර් කොළ හෝ ෆුල්ස්කැප් කොළ මේ සඳහා භාවිත කළ හැකිය). පිළිතුරු ලිවීමේ දී කළු බෝල් පොයින්ට් පෑනක් භාවිත කිරීම සුදුසු වේ.
4. සාමාන්‍ය පරීක්ෂණයකදී මෙන් ඔබේ පිළිතුරු පරිගණකගත කිරීම හෝ යතුරු ලියනය කිරීමට අවසර නොලැබේ. නමුත් දෘශ්‍යාබාධිත සිසුන් වැනි විශ්වවිද්‍යාල පාලනාධිකාරිය විසින් අවසර ලබා දී ඇති සිසුන් සඳහා මෙම නියමය අදාළ නොවේ.
5. කරුණාකර **ඔබේ විභාග අංකය පිළිතුරු පත්‍රයේ සෑම පිටුවකම ඉහළ දකුණු කෙළවරේ** සටහන් කරන්න. පිළිතුරු පත්‍රයේ කිසිදු ස්ථානයක ඔබේ නම සඳහන් කිරීමෙන් වළකින්න.
6. පහත දැක්වෙන ආකෘතිය භාවිත කර පිළිතුරු පත්‍රයේ **පහළ පිටු** අංකනය කරන්න: උදා. එය පිටු 5 කින් සමන්විත නම් 1/5, 2/5… ආදී වශයෙන්.
7. ඔබේ පිළිතුරු පත්‍රයේ පළමු පිටුව ලෙස **පොදු මුල් පිටුව** (එය LMS මගින් ලබාගත හැකි ය.) භාවිත කරන්න (බලන්න: ඇමුණුම I). අදාළ පොදු මුල් පිටුව මුද්‍රණය කිරීමෙන් හෝ අත් අකුරින් පිටපත් කිරීමෙන් ඔබට ලබා ගත හැකි වේ.
8. පිළිතුරු පත්‍රයේ **මුළු පිටු ගණන** ඔබේ පිළිතුරු පත්‍රයේ මුල් පිටුවේ සඳහන් කළ යුතු ය.
9. **පිළිතුරු පිටපතෙහි ඡායාරූප පරිලෝකනය කර (Scan) එය තනි PDF ගොනුවකට පරිවර්තනය කරන්න**. පරිලෝකනය කරන ලද රූපයේ සම්පූර්ණ පිටුව නිසියාකාරව ආවරණය වී ඇති බවට වග බලා ගන්න.
10. පිළිතුරු පත්‍රයේ පරිලෝකනය කළ රූපය පැහැදිලි හා කියවිය හැකි බවට වග බලා ගන්න.
11. LMS වෙත තනි පිටු වෙන වෙනම උඩුගත කිරීමට (Upload) ඉඩ නොදෙන බව සලකන්න.
12. **පිළිගත හැකි එකම ගොනු ආකෘතිය PDF වේ. අපේක්ෂකයාගේ විභාග අංකය PDF ගොනුවේ නාමය ලෙස භාවිත කළ යුතු ය.** උදා. A 12345.
13. ඔබගේ පිළිතුරු පත්‍රය JPEG/JPG හෝ වෙනත් ගොනු වර්ගයකින් උඩුගත කිරීමට (Upload) ඔබට අවසර නොලැබේ.
14. ඔබගේ ලිඛිත පරීක්ෂණවල අවසාන අනුවාදය **පැය 05 ක් ඇතුළත** LMS වෙත උඩුගත කිරීමට (Upload) කටයුතු කරන්න .
15. ඔබගේ පිළිතුරු පත්‍රය නිසි ආකාරයට යොමු කළ බව සනාථ කරගැනීම සඳහා 'ඉදිරිපත් කරන ලදී (Submitted)' යන වචනය සමඟ LMSහි **සම්පූර්ණ පිටුවේ තිර රුවක් (Screen shot)** ගන්නා ලෙස සිසුන්ට උපදෙස් දෙනු ලැබේ.
16. LMS වෙත පිළිතුරු පත්‍රයක් උඩුගත කිරීමේදී (Upload) යම් තාක්ෂණික ගැටලුවක් ඇති වේ නම් අපේක්ෂකයෙකුට ඔවුන්ගේ පිළිතුරු පිටපත විද්‍යුත් තැපෑලෙන් exam3@arts.cmb.ac.lk වෙත හැකි ඉක්මණින් යොමු කරන්න.

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

# ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය (මාර්ගගත)

# පළමු සෙමෙස්තරය – 2020/2021

# ENH 3144 – බුදු සමය හා වර්තමාන සමාජ ප්‍රශ්න

**විවෘත ග්‍රන්ථ ලිඛිත පරීක්ෂණය**

- කාලය: පැය 05 ක් තුළ පිළිතුරු සම්පූර්ණ කොට පිළිතුරු පත්‍රය LMS වෙත උඩුගත කළ යුතුය.
- ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු (ලකුණු 20 බැගින්) හිමිවේ.
- එක් ප්‍රශ්නයකට ඔබගේ පිළිතුරු **වචන 1000කට** නොවැඩි විය යුතුය.

---

1. සමාජය හා සමාජයේ ලක්ෂණ පිළිබඳ බෞද්ධ ස්ථාවරය පැහැදිලි කොට බුදුසමයේ සමාජ අදාළත්වය පරීක්ෂා කරන්න.

2. සමාජ විවිධත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අන්තර්පුද්ගල ගැටුම් නිවාරණයෙහිලා කොතෙක්දුරට අදාළ කරගත හැකිදැ'යි සාකච්ඡා කරන්න.

3. සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ ස්ථාවරය සිඟාලෝවාද සූත්‍රය ඇසුරෙන් පරීක්ෂා කරන්න.

4. නූතන සන්නිවේදන මාධ්‍ය සඳහා අවශ්‍ය සදාචාර ධර්ම පද්ධතියක් සැකසීමේදී අන්තර්ගත කළ හැකි බෞද්ධ ඉගැන්වීම් කවරේදැ'යි පෙන්වා දෙන්න.

5. දිළිඳු බව පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කොට එය පිටුදැකීමෙහිලා බුදුසමයෙන් ඉදිරිපත් කෙරෙන යෝජනා කූටදන්ත සූත්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.

6. මූලධර්මවාදී ආගමික ප්‍රවණතා විෂයයෙහි බලපාන හේතු සාධක පෙන්වා දී දෘෂ්ටිය පිළිබඳ බෞද්ධ විග්‍රහයෙන් එවැනි ප්‍රවණතා ප්‍රතික්ෂේප වන අයුරු විවරණය කරන්න.

********************